# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 1682/45 - 2010 දෙසැම්බර් 02 වැනි බ්‍රහස්පතින්දා - 2010.12.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2003 අංක 03 දරන ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වන 2010 අංක 01 දරන ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ සංශෝධිත ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් 2010 ඔක්තෝබර් මස 14 වැනි දින සම්මත කරන ලදුව 2010 ඔක්තෝබර් 26 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,<br>
පළාත් සභා ලේකම්,<br>
ඌව පළාතේ පළාත් සභාව.

**ඌව පළාතේ පළාත් සභාවේ 2003 අංක 03 දරන ඌව පළාතේ "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වන 2010 අංක 01 දරන ඌව පළාතේ පළාත් සභාවේ"ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ ප්‍රඥප්තියයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය ඌව පළාතේ "2010 අංක 01 දරන ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ (සංශෝධිත) ප්‍රඥප්තියයි" යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 2003 අංක 03 දරන ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තියේ 03 (2) ආ වගන්තියේ "ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා" යන වගන්තිය වෙනුවට "ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හෝ ඔහු විසින් නම් කරන ඔහුගේ නියෝජිතයෙකු" වශයෙන් යන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 03 (2) ආ වැනි වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ අංක 12 වැනි වගන්තිය ලෙස පහත සඳහන් වගන්තිය ඇතුළත් කරනු ලැබේ :– — ප්‍රධාන ප්‍රඥප්තිය අංක 12 වන වගන්තිය ඇතුළත් කිරීම.

"මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපවත්නේය." — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

12-549


1A - PG 001200—340 (2010/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.